# 2023.01.12 වන දින පැවති බුත්තල ප්‍රාදේශීය සභාවේ මාසික සභා රැස්වීම් වාර්තාව (2023 ජනවාරි මාසය )

**සහභාගිත්වය:-**

| | | |
|---|---|---|
| 1. නිකවත්තේ නන්දසිරි මැතිතුමා | - | ගරු සභාපති |
| 2. ඩබ්.ඒ. රංජිත් වික්‍රම ආරච්චි මැතිතුමා | - | ගරු උපසභාපති |
| 3. ශ්‍රියානන්ද කළුපහන මැතිතුමා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 4. එම්.ජී.ලසන්ත පුෂ්ප කුමාර මැතිතුමා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 5. ඉන්ද්‍රසේන ලියනආරච්චි මැතිතුමා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 6. එච්.පී.සංජීව ප්‍රදීප් මැතිතුමා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 7. එම්.ඩී.ඩබ්.ඒ.ප්‍රියදර්ශන මැතිතුමා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 8. එච්.කේ.කේ.දේනුක කසුන්ජිත් මැතිතුමා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 9. ඒ.එම්.එස්.සී.අත්තනායක මැතිතුමා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 10. එච්.එම්.ජී.චන්ද්‍රදාස මැතිතුමා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 11. ඩී.එම්.අජිත් කුමාර මැතිතුමා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 12. ලසන්ත ලක්මාල් මතගවීර මැතිතුමා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 13. ඩී.එම්.එස්.මධුහර්ෂණී චන්ද්‍රසේන මැතිතුමිය | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 14. පී.ඉන්ද්‍රාණී මුතුකුමාරණ මැතිතුමිය | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 15. ඩී.එම්.අනුලාවතී මැතිතුමිය | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 16. ආර්.එම්.එච්.ශාන්ති රත්නායක මැතිතුමිය | - | ගරු ප්‍රා දේශීය සභා මන්ත්‍රිනී |
| 17. ඩී.එම්.තිලකරත්න මැතිතුමා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 18. කේ.එල්.එස්.ආර්.ජයකොඩි මැතිතුමිය | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 19. ආර්.එම්.සුනිල් මැතිතුමා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 20. ආර්.එම්.එම්.පී.රාජපක්ෂ මහත්මිය | - | සභා ලේකම් |

2023 ජනවාරි මස ප්‍රාදේශීය සභා මාසික රැස්වීම 2023.01.12 වන දින පෙ.ව. 9.30 ට ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් බුත්තල ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරයේදී ආරම්භ වූ අතර ගරු උප සභාපති ඩබ්.ඒ.රංජිත් වික්‍රමආරච්චි මැතිතුමා,එච්.කේ.කේ.දේනුක කසුන්ජිත් මැතිතුමා,ඩී.එම්.අජිත් කුමාර මැතිතුමා,ලසන්ත ලක්මාල් මතගවීර මැතිතුමා, කේ.එල්.එස්.ආර්.ජයකොඩි මැතිතුමිය, ආර්.එම්.සුනිල් මැතිතුමා, එච්.එම්.ජී.චන්ද්‍රදාස මැතිතුමා, ඉන්ද්‍රසේන ලියනආරච්චි මැතිතුමා,සභාව ආරම්භයේදී සභාවට පැමිණ සිටින ලදී. ගරු සභාපතිතුමා විසින් පැමිණ සිටින මන්ත්‍රී මණ්ඩලය ඇතුළු සියලු දෙනා පිළිගන්නා ලද අතර ආගම සිහිකිරීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

**01.පසුගිය වාර්තාව සම්මත කර ගැනීම.**

පසුගිය සභාවේ වාර්තාව සම්මත කර ගැනීමේ අවස්ථාව බවත්, එම වාර්තාවේ සංශෝධන තිබේනම් ඉදිරිපත් කර වාර්තාව සභා සම්මත කර ගන්නා ලෙසත් ගරු සභාපතිතුමා විසින් සභාවට දන්වන ලදී.

පෙ.ව 9.40 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩී.එම්.අනුලාවතී මැතිතුමිය පැමිණෙන ලදී.
පෙ.ව 9.41 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී ඩී.එම්.තිලකරත්න මැතිතුමා පැමිණෙන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්.ඒ. රංජිත් වික්‍රම ආරච්චි මැතිතුමා අදහස් දක්වමින්**

ගරු සභාපතිතුමණි,ගිය සභාවාරයේදී මම කරපු කතාව විකෘති කරලා දාලා තියෙන්නේ.මං හිතන්නේ මේ වාර්තාව කොමසාරිස්තුමාට යවන්න ඇති.මම කියපුවා එකක්වත් දාලා නැහැ.මගේ දුරකතනයේ තියෙනවා

මම කරපු කතාව ඒක දාන්න.එදා ලේකම්තුමියත් එක්ක සභාවට ආව නිලධාරීන් දෙන්නා කතා කරපු ඔක්කොම රෙකෝඩ් කරලා තිබෙනවා.ලෙඩ නිවාඩු දාපු නිලධාරීන් පසුදා ඇවිත් ඒ දෙන්නට බැනලා ඒවා සේරම මකලා තිබෙනවා.සභාපතිතුමා දැනුවත්ද නැද්ද දන්නේ නෑ.මට ආරංචි විදිහට ඒවා සම්පූර්ණයෙන්ම මකලා. මම කතා කරපු ඒවා කිසිම දෙයක් නෑ.මේකේ වෙනම අදහසක් තමයි දෙන්නේ කොමසාරිස්තුමාගේ නම කිව්වේ මංගල මහත්තයා කියලා මේකේ තියෙන්නේ සුරේෂ් කියලා.එහෙම හොඳ නෑ.එහෙම කරන්නේ කවුද?සභාව අමුතු විදිහකට ගිහින් තියෙන්නේ.මේකේ තියෙන විදිහට මන්ත්‍රීතුමන්ලා වැරදියි ලෙඩ නිවාඩු දාපු නිලධාරීන් තමයි සාධාරණ කියලා.මම මේක අනුමත කරන්නේ නෑ.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති නිකවත්තේ නන්දසිරි මැතිතුමා විසින් ඉදිරිපත් කරන යෝජනා**

සභා වාර්තාව කල්දාන්න බෑ.සංශෝධන සහිතව සම්මත කරන්න

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි කේ.එල්.එස්.ආර්.ජයකොඩි මැතිතුමිය අදහස් දක්වමින්**

.සභාපතිතුමණි,ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි.පසුගිය සභා වාර්තාවේ.මම කිව්වේ හේමාලී මන්ත්‍රිතුමිය බීජ ඇට බෙදුවා කියලා.මම එතන කළ ප්‍රකාශය සටහන් කර තිබෙන්නේ " මට කවුරුත් ඕන නෑ කියලා" නමුත් එක මම කිව්වේ "මට කවුරුත් ඕනි කියලා" සංශෝධනය විය යුතුයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඉන්ද්‍රසේන ලියනආරච්චි මැතිතුමා අදහස් දක්වමින්**

සුසාන භූමි සම්බන්ධයෙන් අංක 33 සුසාන භූමිය පිහිටා තිබෙන වසම සටහන් කර ඇත්තේ පැල්වත්ත යනුවෙනි.එය මහසෙන්පුර ලෙස සංශෝධනය විය යුතුය.

මාසික සභා වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලසන්ත ලක්මාල් මතහවීර මැතිතුමා විසින් යෝජනා කළ අතර, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී කේ.එල්.එස්.ආර්.ජයකොඩි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් පසුව, බෙදීමක් නොවූයෙන් පසුගිය සභා වාර්තාව කියෙව්වා සේ සලකා ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**සංශෝධන නිවැරදි කිරීම**

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්.ඒ. රංජිත් වික්‍රම ආරච්චි මැතිතුමා අදහස් දක්වමින්**

අද දින සභාව ලෙඩ නිවාඩු දාලා තියෙන්නේ මං නිසා.ඒක මං ඔබතුමාලට කියන්න ඕනි. ප්‍රසම්පාදන කමිටුව තිබුණා දෙසැම්බර් 01 වන දින. කමිටුව තියෙන වෙලාවේ මං ලේකම්තුමියගෙන් ඇහුවා අපේ සභාවේ අවුරුදු 05ට වැඩියෙන් ඉන්න සේවකයෝ යවන්න ලියුම ගැහුවද කියලා ආණ්ඩුකාරතුමාට.ඊට ඉස්සෙල්ලා මට කිවුවා 11.23 මේ ලියුම යැවුවා කියලා.මේවා දැනගන්න ඕනි මන්ත්‍රීලා. නැත්තම් මං කියනවා දාන්නත් ඕනි. අනිත් එක කොමසාරිස්තුමාටත් මං මේ කියන වචන ටික සේරම යවන්නත් ඕනි. වාර්තාවෙත් සඳහන් වෙන්න ඕනි. ලේකම්තුමිය මට කිව්වා 11.23 මේ ලියුම යැවුවා කියලා. මේ ලියුම ඊට පස්සේ මං 12.01 වන දින ප්‍රසම්පාදන කමිටුවේදී ඇහුවා මේ ගැන. ඔව් යැවුවා කිව්වා. මං කිව්වා මට ඒ පොත් දෙක බලන්න ඕනි කියලා. මට අයිතියක් තියෙනවානේ, මං උපසභාපති. රෙජිස්ටර් ලියුම් යවන්න පොතක් තියෙනවා ලකුණු කරලා තියෙන්න ඕනි. නැත්නම් නෝමල් යවන එකේ යවන්න ඕනි. ඊට පස්සේ සභාපති මහත්තයත් ගියා රැස්වීමකට මේ එහා පැත්තේ. ලේකම්තුමියත් ගියා. මම කිව්වා මහේෂ් මහත්තයාට මේ ගැන බලන්න කියලා. පැය භාගයක් විතර හෙව්වා. නෑ. යවපු තැනක් නෑ. ඊට පස්සේ කසුන් කිව්වා උප සභාපති මහත්තයා මේ පොත් දෙකේ නැත්නම් ඉතිං යවලා නෑ කිව්වා. ඊට පස්සේ මං කිව්වා, මේ ඉන්න සේවකයෝනේ. මේ

නිළධාරි මේ සභාපති මහත්තයාට වගේ වැඩ කරන්න මාත් එක්ක බෑ. සභාපති මහත්තයා බබා පෙන්නුවට මාත් එක්ක බෑ. මේක හොයලා කියන්න ඕනි කියලා මං ගෙදර ගියා. ගෙදර ගිහිල්ලා ආණ්ඩුකාරතුමාට කෝල් එකක් දුන්නා මං හරියට 01.22 ට. ආණ්ඩුකාරතුමාගෙන් ඇහුවා මං ගරු ආණ්ඩුකාරතුමණි, මං උප සභාපති බුත්තල. ඊට පස්සේ මං ඇහුවා අහවල් දිනයේ ලියුමක් ආවේ නැද්ද ඔබතුමාට කියලා. සභාවෙන් තීරණයක් ගත්තා අවුරුදු 05 ට වැඩි අය මාරු කරන්න කියලා. නෑ මට ආවේ නෑ මං ගයාන්ගෙන් අහලා කියන්නම් කිව්වා. ගයාන්ගෙනුත් ඇහුවා නෑ කිව්වා. ඊට පස්සේ මං කතා කළා ලේකම්තුමියට, ලේකම්තුමියත් කිව්වා නෑ කියලා. මං කිව්වා දැන් ආණ්ඩුකාරතුමාට යැව්වා කිව්වානේ කියලා. මේක ගිහිල්ලා නැනේ. ඊට පස්සේ කිව්වා මං ඒක ආණ්ඩුකාරතුමාට ෆැක්ස් කරන්නම් කිව්වා ඒ ලියුම. මේක බොරු වැඩේනේ කරේ . මතකනේ එකපාරක් පක්ෂෙට ලියුමක් ගහන්නම් කියලා ඒකත් ඇද්දා මං මෙතනදි. ඒකත් මේ ෆැක්ස් යැව්වාට පස්සේ තමයි ඒකත් ලැබුණේ. ඉතිං මං කියන දෙයක් නිලධාරින් අහන්නේ නැත්නම් මං ආය වචනයක්වත් උඹ වත් කිව්වේ නෑ. මං  කිව්වේ සභාපති මහත්තයා නැලෙව්වාට මං නලවන්නේ නෑ කිව්වා. ඒකයි ඔතන ඔය ලෙඩ නිවාඩු දාලා. ආය ඒකටත් එයාලා අත්සන් කරලා තිබුණා. තවත් එකක් මං දවසක් යද්දි සභාවේ යන්ත්‍රෝපකරණ ඒකකයේ ඕම්බි ගගහ හිටියා. මං ඇහුවා සභාපති මහත්තයගෙන්, ඊට පස්සේ  නිලධාරින්ගෙන් ඇහුවා. මහේෂ් මහත්තයා හිටියේ. මහේෂ් මහත්තයට කෝල් එකක් දීලා ඇහුවා මේ වැඩේ හරිද ? ඊට පස්සේ මහේෂ් මහත්තයා කිව්වා වැඩ කරන්න මේවා හදලා දෙන්නේ නෑ. ඊට පස්සේ මං සභාවේ ඇවිල්ලා කිව්වා ඇයි මේවා හදලා දෙන්නේ නැත්තේ. මං යනකොට මෙන්න මේ වගේ වැඩක් වුණා. මං යනකොට ඔක්කොමලා ඕම්බි ගහනවා ඔබතුමාලා ඔක්කොමලා හිටියා. මාධ්‍යයේ දාලා තිබුණා මේක කුඩු ගහලා . ඒකට උද්ඝෝෂණ කරා.  මං සති 2කට පස්සේ ඇවිල්ලා ඒ කට්ටියත් එක්ක සාකච්ඡා කළා. ඒ කට්ටිය නිරවුල්ව මාත් එක්ක කතා කළා.  හිටපු TO මහත්තයා පළාත් සභා හිටපු අපේ වැලිවිට මහත්තයාගෙන් සල්ලි වගයක් ඉල්ලලා තිබ්බා. මාස ගාණක් කරේ නෑ.  වැලිආර වතුර යෝජනාව. ඊට පස්සේ මං ගොවි සංවිධානයකට කියලා මෙහෙමයි කියලා මේක කරන්න කියලා මිනිසුන්ට හදලා දුන්නා. මගේ ඉල්ලීම් පිට තමයි ඒ කට්ටිය ඒක කරේ. මං සභාවේ ඉන්නේ කිව්වට පස්සේ TO මහත්තයාට සල්ලි දෙන්නම් කිව්වා. ඒ කට්ටිය ඒකට 5%ක් ඉල්ලනවා. ඇත්ත කතා කරන්න එපැයි. මාත් කිව්වා TO මහත්තයාට මෙහෙම කරන්න එපා කියලා කිව්වාට පස්සේ  එයා මාස ගාණක් ඇද්දා. අර බට කඩෙන් අරන් දුන්නේ මං. ණයට කඩෙන්. ඊට පස්සේ කියලා කියලා කියලා සභාපති මහත්තයාටත් කියලා කොහොමහරි ලක්ෂ 5 ක් අරගෙන. 5 %ක් දෙන්න කියලා කොහොමහරි රුපියල් තිස්දාහක් පනස්දාහක් කපාගෙන. ඒකට මං කෑ ගැහුවා TO මහත්තයාට ඇයි එහෙම කරන්නේ අසාධාරණ වැඩ. TO මහත්තයා 5%ක් ගත්තම කොන්ත්‍රාත්කාරයත් හොරකම් කරනවානේ. ඊට පස්සේ අරවා ක්‍රියාත්මක වෙන්නේ නැනේ. නේද? අරක හරියට කරන්න. අන්න ඒ ටික තමයි අරගලයට අද නිවාඩු දාන්න අරගෙන තියෙන්නේ. එදා මං පළවෙනිදා කතා කරලා ගියාට පස්සේ මට මෙහෙන් කෝල් එකක් දුන්නා  සභාපති මහත්තයත් එක්ක සාකච්ඡාවක් තියෙනවා ඒ කට්ටිය, ඊට පස්සේ එතන ඉදන් කතා වෙලා තියෙනවා මං සභාවට එන වෙලාවට මගේ ඇගේ හැප්පිලා හරි වලියක් දාගන්නවා කියලා. වගකීමෙන් කියන්නේ. මං ඒ වෙලාවේ සභාපති මහත්තයට කතා කරලා කිව්වා, සභාපති මහත්තයා ඇහුවා ඔබතුමාගේ මේසේ ඉදන් මෙහෙම කියලා තියෙනවා. මේ විදිහට. ඊට පස්සේ සභාපති මහත්තයත් කිව්වා ඔව් ඔව් මෙහෙම වුණා. ඒක සමථයකට පත්වුණා. කියලා කිව්වා. ඊයෙත් මට සභාවෙන් කෝල් එකක් දීලා කිව්වා. මං මේ පාවා දීමක් නෙවෙයි කරන්නේ. ඒ කට්ටිය නිවාඩු දානවලු. දැන් සභාපති මහත්තයාගේ මේසය වටේ ඔක්කෝම ඉන්නවා සාකච්ඡාවක්. සභාපති මහත්තයා අද වෙනකල් මට කිව්වේ නෑ. ඒ කට්ටිය ලෙඩ නිවාඩු දාලා කියලා. මං උපසභාපතිනේ. මට කියන්න එපැයි. පක්ෂය හරිනම්. මං ඇවිල්ලා කිව්වා සභාපති මහත්තයා ඇයි මේ කට්ටිය ලෙඩ නිවාඩු. මේ තියෙන්නේ ලියුම.මං දන්නෙත් ඊයේ හැන්දෑවේ 5 ට විතර 12ට මට කෝල් එක දුන්නා මෙයත් එක්ක සාකච්ඡාවක් තියෙනවා කියලා. එහෙම කරන්න එපා සභාපතිතුමා අනිත් එක හොරුන්ට ඉඩ දෙන්න එපා. අපි රුපියලක් හබ්බ කරලා නෑ අපේ දරුවෙකුටවත් කන්න දීලා නෑ මේ සභාවෙන්. ඒකයි හිතට අමාරු. සභාපති මහත්තයා ඒ හොරු තියාගන්න රකිනවනම්. අපේ සභාවෙන් මං යෝජනා කලේ අවුරුදු 5ට වැඩිය ඉන්න කට්ටිය මාරු කරන්න කියලා අන්න ඒ කැක්කුම තමයි මේ නිලධාරින්ට තියෙන්නේ. ඒ කට්ටිය මේ සභාවෙන් ගියත් හෙට මේ සභාව හොඳ තත්ත්වයක ඉන්න

මන්ත්‍රීලාට හරි කරන්න නිලධාරි පත්කරගන්න ඕනි. ඒක තමයි තියෙන්නේ. ඊයේ රෑත් මට CID එකෙන් කතා කරා. මම සියලු තොරතුරු ඔක්කොම දුන්නා. මෙහෙම දෙයක් තියෙනවා කියලා කියන්න තියෙන සියලුම දේ කිව්වා. හැබැයි සභාපතිතුමා ඔබතුමා හොරකම් කළාද නැත්ද කියලා දන්නේ නෑ අපි.ඒකට වරදක් කියන්න බැනේ. හොරු ආරක්ෂා කරන්න එපා. මේක මට සැහෙන්න හිතේ අමාරුයි. මම මේ සභාවේ කතා කරන්නේ සාධාරණව සාධාරණ පැත්තට කතා කරන ආසාධාරණය පෙන්වන්න බැරි, අසාධාරණ නැතුව සාධාරණව කතා කරන්න එතකොට තමයි මේ ලියුම හරි වෙන්නේ. මෙන්න මේ රජයේ නිලධාරි නිසා තමයි මේ ආණ්ඩුව, මොන ආණ්ඩුව වුණත් ගෙනියන්න බෑ. මේ අරගලකරුවෝ නිසා එක්කෝ ලෙඩ නිවාඩු. මන්ත්‍රීකෙනෙක් කොහොමද මේ සභාවට ඇවිල්ලා වාඩිවෙලා කතා කරලා යෝජනා කරලා කරන්නේ දෙයක්. මන්ත්‍රීවරු මොනා හරි කිව්වොත් වාඩිවෙලා ඉන්නවා. නැත්නම් නියපොතු කනවා. මේවා නැතිකරන්න ඕනි. පාර්ලිමේන්තුවට දාලා නැතිකරන්න ඕනි.තව එකක් තියෙනවා. ඒකේදී මං බය නෑ. මං ඕන තැනක ඕන CID එකකට අරන් යන්න මං කටඋත්තර දෙනවා. ඒක නිසා ඔබතුමාලා මට උත්තර දෙන්න ඒකට. මං ලේකම්තුමියටත් ඊයේ කතා කරලා. කට්ටියක් කතා කරලා කිව්වා. ඔබතුමාට අපි හරි ආදරෙයි.ඔබතුමා කෙලින් මිනිහෙක්. ඒ වුණාට අපිටත් මේකට ලෙඩ නිවාඩු දාන්න වෙනවා මේක ඔක්කොමලත් එක්ක ගන්න තීරණයක්නේ. ඒක නිසා අපි ලෙඩ නිවාඩු දානවා කියලා. මං කිව්වා කමක් නෑ ලෙඩ නිවාඩු දාන්න කියලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි කේ.එල්.එස්.ආර්.ජයකොඩි මැතිතුමිය අදහස් දක්වමින්**

සභාපතිතුමා උපසභාපතිතුමා ඇතුළු ලේකම්තුමියගෙන් අවසරයි.සභාපතිතුමණි,මගේ නිවස අසල සිටින මන්ත්‍රීතුමියට බීජ ලැබිලා නෑ කිව්වා.පක්ෂ භේදයකින් තොරව සියලු දෙනාටම බීජ බෙදුවා. ආර්ථික සංවර්ධන නිලධාරිතුමායි, කෘෂිකර්ම නිලධාරිතුමයි ලිස්ට් එක හැදුවේ. රාජ්‍ය සේවකයින්ටත් මේක ගෙවතු වගාවක් ලෙස කරන්න කියලා මමත් ලිස්ට් එකක් දුන්නා. ඉතුරු වුණ බීජ ඒ අයට බෙදලා දුන්නා. කිසිම සමිතියක් නෑ. මහගොඩයාය වසමට තෝරලා බේරලා දුන්නේ නෑ. මට කවුරුත් ඕනි. ලබන අවුරුද්දේ ඡන්දයක් තියෙන්නත් පුළුවන්. නැතිවෙන්නත් පුළුවන්. ලබන්නා වූ 2023 වසර සුභ වන වසරක් වේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා.

<u>**පැවරුම් නියෝග මඟින් අප සභාවට පවරා ගැනීමට ඇති සුසාන භූමි ඉඩම් පිළිබඳ විස්තර**</u>

| අනු අංකය | භුක්ති විඳින ඉඩමේ නම | පිහිටි ග්‍රාම නිලධාරි වසම |
|---|---|---|
| 33 | 6 කණුව සුසාන භූමිය | මහසෙන්පුර |
| 34 | උඩඅරාව සුසාන භූමිය | උඩඅරාව |
| 35 | කුමාරපුර සුසාන භූමිය | ජනාවාස |

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී ආර්.එම්.එච්.ශාන්ති රත්නායක මැතිතුමිය පෙ.ව 9.40 ට සභාවට පැමිණෙන ලදී.

**03.සභාවට ඉදිරිපත් කරන පෙත්සම් පැමිණිලි හා සංදේශ ඉදිරිපත් කිරීම**

01. ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සහකාර අධ්‍යක්ෂ (අධ්‍යාපන පුහුණු) විසින් 2022.12.27 දිනැතිව ලිපියක් ඉදිරිපත් කරමින් හා ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් සභාපතිතුමා වෙත ලිපියක් එවා ඇත. එම ලිපියට අනුව ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) එක්ව ක්‍රියාත්මක කරනු ලබන මහජන පුස්තකාල ස්වයංක්‍රීයකරණ ව්‍යාපෘතිය 2022-2023 මෙම ව්‍යාපෘතිය පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරනු ලබන පළාත් පාලන

ආයතනයන්හි ධාරිතා සංවර්ධන වැඩසටහන (Capacity Development of Local Goverments) හා සමගාමීව දියත් කරනු ලබන ව්‍යාපෘතියකි.
මෙම ව්‍යාපෘතියට යටතේ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයෙහි මෙහෙයවීමෙන් උතුර, නැගෙනහිර, ඌව සහ උතුරු මැද පළාත් හි දිස්ත්‍රික්ක 11ක තෝරාගත් මහජන පුස්තකාල 18කට අයත් පුස්තකාලයන්හි ස්වයංක්‍රීයකරණ පහසුකම් සංවර්ධනය කිරීම අරමුණ වේ. මෙමගින් පාඨක ප්‍රජාව වෙත පහසුවෙන් හා කාර්යක්ෂම ලෙස තොරතුරු හුවමාරුව හා මාධ්‍යය පරිහරණය කිරීමට පහසුකම් ලබා දෙමින් ස්වයංක්‍රීයකරණ පුස්තකාල අත්දැකීම් ලබා ගැනීම සඳහා ඉඩ පහසුකම් විවර කර දීම අපේක්ෂා කරයි. මෙම ව්‍යාපෘතිය යටතේ බුත්තල මහජන පුස්තකාලය සංවර්ධනය කිරීමට තෝරාගෙන ඇති බව දන්වා ඇත.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ශ්‍රියානන්ද කළුපහන මැතිතුමා පෙ.ව 9.45 ට සභාවට පැමිණෙන ලදී.

02. බුත්තල ප්‍රාදේශිය සභාවේ සභා ලේකම්තුමිය විසින් 2023.01.03 දිනැතිව ලැප්ටොප් පරිගණකයක් ලබා ගැනීම සඳහා ලිපියක් ඉදිරිපත් කර ඇත. එම ලිපියට අනුව කාර්යාලයේ කටයුතු සිදු කිරීමේදී හා Zoom තාක්ෂණය ඔස්සේ රුස්වීම් සඳහා සහභාගී වීමේදී ලැප්ටොප් පරිගණකයක් අත්‍යාවශ්‍ය බව සඳහන් කර ඇත.
එම් යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ලසන්ත ලක්මාල් මතහවීර මැතිතුමා ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා විසින් සභාවේ එකගතාවය විමසීමෙන් පසුව, එම යෝජනාව සම්බන්ධයෙන් බෙදීමක් නොවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

03. බුත්තල ප්‍රාදේශිය සභාවේ සංවර්ධන නිලධාරි ඒ.එම්.යූ.ජී.අබේකෝන් මිය විසින් 2023.01.04 දිනැතිව ලැප්ටොප් පරිගණකයක් ලබා ගැනීම සඳහා ලිපියක් යොමු කර ඇත. එම ලිපියට අනුව LDSP ව්‍යාපෘතියට අදාළ රාජකාරී කටයුතු සිදු කිරීමේදී පුහුණු සැසි වලට සහභාගී වීම මහත් දුෂ්කරතා වලට පත් වූ අවස්ථාද ඇත. එමගින් LDSP ව්‍යාපෘතියට අදාළ රාජකාරී කටයුතු නිසි අයුරින් පවත්වාගෙන යාමට නම් ලැප්ටොප් පරිගණකයක් අත්‍යාවශ්‍ය බව දන්වා ඇත.
එම් යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ලසන්ත ලක්මාල් මතහවීර මැතිතුමා ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා විසින් සභාවේ එකගතාවය විමසීමෙන් පසුව, එම යෝජනාව සම්බන්ධයෙන් බෙදීමක් නොවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

04. R.35/1, රාත්‍රී වැව , මාලිගාවිල, යන ලිපිනයේ පදිංචි ආර්.එම්.බී.ධර්මසිරි මහතා විසින් 2023.01.08 වන දිනැතිව මාර්ගය ප්‍රතිසංස්කරණය කර බෝක්කුවක් දමා දෙන ලෙස ඉල්ලීමක් කරමින් ලිපියක් යොමු කර ඇත. රාත්‍රී වැව ගම්මානයේ පිහිටි සනි විමලසිරි මහතාගේ නිවසේ ඉදිරිපිටින් ආරම්භ වන බොස් වැව මාර්ගය මීටර 500ක පමණ දුරක් අබලන් තත්ත්වයේ පවතින බැවින් එම අතුරු මාර්ගයේ වෙසෙන පවුල් 12ක පමණ ජනතාව ඉතා දීර්ඝ කාලයක සිට දැඩි අපහසුතාවලට ලක්ව ඇත. වර්ෂා කාලයේදී මෙම මාර්ගයේ වාහන වලට මෙන්ම පයින් ගමන් කිරීමටද නොහැකි බැවින් ඉහත ඉල්ලීම ඉටු කර දෙන ලෙස ඉල්ලීම් කර ඇත.
ගරු සභාපතිතුමා විසින් සභාවේ එකගතාවය විමසීමෙන් පසුව, එම යෝජනාව සම්බන්ධයෙන් බෙදීමක් නොවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

05. ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) ගේ අංක MPH/HWY/PLM/01/87-V01.IV දරණ 2022.12.05 දිනැතිව සංවර්ධන යෝජනා ඉදිරිපත් කිරීම පිළිබඳ ලිපියක් යොමු කර ඇත. ඒ අනුව බුත්තල ප්‍රාදේශිය සභාවේ සභාපති විසින් අතිගරු ජනාධිපතිතුමා වෙත යොමු කරන ලද අංක බු/ප්‍රාස/පොදු ලිපිය, ජනාධිපති කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල් (මහජන සම්බන්ධතා) විසින් මුදල්

අමාත්‍යාංශය වෙත යොමු කරන ලද අංක PS/PR/24/05/431601 සහ ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් එවන ලද අංක NDP/RD/Gen හා 2022.11.22 දිනැති ලිපිය හා බැදේ. ලිපිවල පිටපත් මේ සමග අමුණා ඇති බව සදහන් කර ඇත. ඒ අනුව, බුත්තල ප්‍රාදේශීය සභාවේ සභාපති විසින් යොමු කර ඇති ලිපියේ සඳහන් අංක 02 (අඩක් වැඩ නිම කල කාපට් මාර්ග සම්බන්ධව ) සම්බන්ධව අවධානය යොමු කරමින් සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා මෙම ලිපිය යොමු කර ඇති බව දන්වා ඇත.

ගරු සභාපතිතුමා විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් පසුව ,එම යෝජනාව සම්බන්ධයෙන් බෙදීමක් නොවූයෙන් ඒකමතිකව සභා සම්මත විය .

06. 17කණුව,රජමාවත,බුත්තල යන ලිපිනය මගින් වල්ලිඅම්මාර ගම ගොවි සංවිධානයේ ලේකම් විසින් 2022.12.24 දිනැතිව ස්තූතිය පුද කරමින් ලිපියක් එවා ඇත. එම ලිපියට අනුව ඔවුන්ට පොහොර ප්‍රවාහනය කර ගැනීමට නොහැකිව ඉතා අපහසුවට ලක්ව සිටියදී බුත්තල ප්‍රාදේශීය සභාවේ ටිපර් රථය යොදා ගොවි සංවිධානයට යූරියා පොහොර නොමිලේ ප්‍රවාහනය කර දුන් කාර්යයට බුත්තල ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා වෙත ස්තූතිය පුද කර සිටින බව ලිපියේ සඳහන් කර ඇත.

07. පහලගම,ඔක්කම්පිටිය,බිදුණුකඩ වැව ගොවි සංවිධානයේ ලේකම් විසින් 2023.01.07 දිනැතිව මාර්ග අලුත් වැඩියා කටයුතු සඳහා මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය ලබා ගැනීම සම්බන්ධව ලිපියක් යොමු කර ඇත. එම ලිපියට අනුව 2022/2023 මහ කන්නයේ බඩ ඉරිගු/වී/වට්ටක්කා අතිරේක ආහාර බෝගවල අස්වනු නෙලීම ඉදිරි දිනයන්හි ආරම්භ කිරීමට නියමිත බවත්, නමුත් අධික වර්ෂාව හේතුවෙන් මාර්ග පද්ධති දැඩි අබලන් තත්ත්යට පත් වී අස්වනු රැගෙන ඒමට නොහැකි වී ඇති බව දන්වා ඇත. එම නිසා නයිපෙන ආර සිට හැබ්බැස්ස පන්සල දක්වා මාර්ගයේ අලුත්වැඩියා කටයුතු සඳහා මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයට ඉන්ධන සමිතිය මගින් ලබා දීමට නියමිත බැවින් යන්ත්‍රය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ඉල්ලීම් කර ඇත.

ගරු සභාපතිතුමා විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් පසුව, එම යෝජනාව සම්බන්ධයෙන් බෙදීමක් නොවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

පෙ.ව.9.46ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ඩී.එම්.එස්.මධුහර්ෂණි චන්ද්‍රසේන මැතිතුමිය පැමිණෙන ලදී.

පෙ.ව.9.55ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඩී.ඩබ්.ඒ.ප්‍රියදර්ශන මැතිතුමා හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.එම්.එච්.ශාන්ති රත්නායක මැතිතුමිය පැමිණෙන ලදි.

පෙ.ව.9.56ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ජී.ලසන්ත පුෂ්ප කුමාර මැතිතුමා පැමිණෙන ලදි.

**04.යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න :-** නැත

**05.යථා පරිදි කල්දී ඇති යෝජනා :-** නැත

**05.01.02 හදිසි යෝජනා**

**05.01.02** විධායක ඉංජිනේරු ,මාර්ග සංවර්ධන අධිකාරිය,මොනරාගල විසින් 2022.12.06 දිනැතිව ලිපියක් ඉදිරිපත් කර ඇත.ඒ අනුව, බුත්තල නගරයේ ඇති කාණු ආවර්ණය කිරීමට යොදා ඇති (Cover Slab) ස්ථාන කිහිපයක් කැඩී ඇති බව ඔබ විසින් ලිඛිතව හා කාර්මික නිලධාරී මහත්මිය දුරකතනයෙන් දැනුම් දුන් බව සඳහන් කර ඇත.ඒ අනුව,අදාල කාණු ස්ථානයෙන් ස්ථානයට වෙනස් වන බැවින් අප සතුව පවතින පෙර නිමිති කාණු ආවරණ (Cover Slab) එම ස්ථානවලට යෙදිය නොහැකි අතර එම ස්ථානයට අදාලව වෙන වෙනම කාණු ආවරණ (Cover Slab) සෑදීමට අවශ්‍ය බව සඳහන් කර ඇත.

රටේ පවතින තත්ත්වය මත අමුද්‍රව්‍ය ලබා ගැනීම අපහසු බැවින් එම අමුද්‍රව්‍ය අප වෙත ලබාදීමට හැකියාවක් පවතිනම් අපගේ කම්කරුවන් යොදවා එය නිමකර සකස් කර දීමට හැකියාව ඇතිබව සඳහන් කර ඇත.

ඒ බැවින්,ඒ පිළබඳව ඇති හැකියාව සොයා බලා අවශ්‍ය අමුද්‍රව්‍ය විශේෂයෙන්ම සිමේන්ති කොට්ට 10 ක් ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇත.

එම් යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලසන්ත ලක්මාල් මතභවීර මැතිතුමා ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් පසුව, එම යෝජනාව සම්බන්ධයෙන් බෙදීමක් නොවූයෙන් ඒකමතිකව සහා සම්මත විය.

**06 කාරක සභා වාර්තා සලකා බැලීම හා දින නියම කර ගැනීම.**

**07 ලැබීම් හා වියදම් පිළිබද මාසික ප්‍රකාශ එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කල යුතු වෙනත් ලේඛන :-**

## යන්ත්‍රෝපකරණ ආදායම් වියදම් විස්තරය – 2022 -ඔක්තෝබර්

| දළ ආදායම | | | දළ වියදම් | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| යන්ත්‍රෝපකරණයේ /වාහනයේ අංකය | මුදලට වැඩ වටිනාකම | පොදු වැඩ වටිනාකම | ඉන්ධන සඳහා වියදම් | අමතර කොටස් හා අළුත් වැඩියාව සඳහා වියදම් | යන්ත්‍ර ක්‍රියාකරුගේ/සහායකගේ වැටුප් | න්ත්‍ර ක්‍රියාකරුගේ/ කගේ වියදම් | මුළු වියදම | ලාභය /පාඩුව |
| **LL-7310** ලොරි ජල බවුසරය | **292,929.00** | **-** | **101,480.00** | **-** | **-** | **16,440.00** | **117,920.00** | **175,009.00** |

*මෝටර් ග්‍රේඩරය හා මාර්ග තලනය ලබා ගැනීම සඳහා දේශිය ණය හා සංවර්ධන අරමුදලෙන් ලබාගත් ණය මුදලේ මාසික ණය වාරිකය රු.**132773.55**

ලැබීම් ගෙවීම් වාර්තාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.අජිත් කුමාර මැතිතුමා යෝජනා කළ අතර, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලසන්ත ලක්මාල් මතභවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

පෙ.ව.9.59ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි පී.ඉන්ද්‍රානි මුතුකුමාරණ මන්ත්‍රීතුමිය පැමිණෙන ලදී.

ගරු සභාපතිතුමා විසින් 2022 නොවැම්බර් මස ලැබීම් ගෙවීම් වාර්තාව සඳහා සභාවේ එකඟතාව විමසීමෙන් පසුව එම යෝජනාව සම්බන්ධයෙන් බෙදීමක් නොවූයෙන් ඒකමතිකව සහා සම්මත විය.

**08. වෙනත් කරුණු :-**

**01.සභාව පැවැත්වෙන දිනය තීරණය කිරීම.**

2023.02.10 දින පෙ.ව 9.30 ට ප්‍රාදේශීය සභා ශ්‍රවනාගාරයේදී 2023 පෙබරවාරි මහ සභා වාරය පැවැත්වීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්.ඒ. රංජිත් වික්‍රමආරච්චි මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ජී.ලසන්ත පුෂ්පකුමාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් පසු බෙදීමක් නොවූයෙන් ඒකමතිකව සහා සම්මත විය.

**02.නොපැමිණි සභිකවරුන්ගේ නිවාඩු අවසරය**

සියලුම ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමන්ලා හා තුමියන්ලා පැමිණ සිටින ලදී

**04.ගරු මන්ත්‍රීතුමන්ලාගේ අදහස් ඉදිරිපත් කිරීම.**

**ගරු ප්‍රාදේශීය සභා උපසභාපති ඩබ්.ඒ.රංජිත් වික්‍රමආරච්චි මැතිතුමා අදහස් දක්වමින්**

ගරු සභාපති ඇතුළු සියලු දෙනාගෙන් අවසරයි. යන්ත්‍රෝපකරණය ගැන කතා කරන විට පරණ මෝටර් ග්‍රේඩරය ලක්ෂ ගානක් වියදම් කරලා හැදුවා කිව්වා. පසුව ඒකේ ජැක්සීල් හදන්න ඕනි කිව්වා. ඒක හදන්න සභාවෙන් අවසර දුන්නා. මේ නිලධාරින් යන ක්‍රමයට මට සැකයක් තියෙනවා එන්ජින් එකත් හැදුවද කියලා. පුද්ගලික තැනකින් හදන්න අනුමැතියක් දැම්මා. ඒකට විරුද්ධ වුණා.කහගොල්ලෙන් හදන්න අනුමැතිය දුන්නා. තාම හදලා නෑ. මට සැකයක් තියෙනවා මෝටර් ග්‍රේඩරයේ එන්ජින් එකත් හදලා නෑ කියලා. අපි විසුරුවා හැරියට පස්සේ ඔහොමම යයි. ලක්ෂ විසි ගාණක් ගියා හදන්න. හදපු එකත් නෑ. හිටපු මන්ත්‍රීවරු ලක්ෂ විස්සම කාලා කියලා කියයි. ඒ නිසා අපට දැන ගන්න බැරිද මේක හදලා ස්ටාර්ට් කරලා ඇයි වැඩ කරන්න බැරි කියලා. ජැක්සීල් ටික ගහන්නේ නැත්තේ ඇයි? මෙච්චර සභාවේ මුදල් තිබිලත්. මාස 09ක් විතර වෙනවා හදන්න කියලා. තාම හදලා නෑ. මේ සභාවේ සේවය කරන නිලධාරීන් සේවය කරන විදිහට එන්ජින් එකත් හදලද කියලා සැකයක් ඇති වෙනවා. හෙට අනිද්දා විසුරුවා හැරියට පසුව මෝටර් ග්‍රේඩරය හදන්න කියලා ලක්ෂ විස්සක් මන්ත්‍රීලා කාලා කියලා අපේ නම යයි. ඒ නිසා මම කැමති නෑ ඒ තත්ත්වේ ගන්න. ඒක නිසා හදලද නැත්ද කියලා දැනුවත් කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති නිකවත්තේ නන්දසිරි මැතිතුමා අදහස් දක්වමින්**

මේ ගැන පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි. මේකේ මූලික ආපදාව වෙනකොට කහගොල්ල යාන්ත්‍රික ඉංජිනේරුගෙන් උපදෙස් අරන් තමයි ගලවලා අරන් ගියේ අලුත්වැඩියා කරන්න.යන්ත්‍රය අලුත්වැඩියා කළේ රජයේ යාන්ත්‍රික වැඩපලෙන් පුද්ගලික ආයතනයකින් නොවෙයි.මේක ගෙනල්ලා එයාලම හයි කළේ.හයිකරලා ස්ටාට් කරලා ඊලඟ වැඩට යනකොට තමයි ජැක්සීල් දිරාපත්වෙලා ජැක්සීල්වලින් ඔයිල් ලීක්වෙන්න පටන් ගත්තේ.ධාවන තත්ත්වයේ තියෙනවද බලන කොට තමයි ඔයිල් ලීක් වුණේ.ජැක්සීල් දාන්න ඕනි කියලා කහගොල්ලෙන් ලක්ෂ 11ක පමණ ඇස්තමේන්තුවක් ආවා. පසුව සභාවට දැම්මා.පුද්ගලික ආයතනයකින් ඊට වඩා අඩුවට කරගන්න පුළුවන්ද බලන්න.නමුත් සභා අනුමැතිය ලැබුණේ නෑ.සභා අනුමැතිය ලැබුණේ කහගොල්ලෙන් කරන්න කියලා.අපි ඉල්ලපු මිල ගණන් දැන් වෙනස් වෙලා තිබෙනවා.නැවත ඇස්තමේන්තුවක් දෙන්න කියලා ඉල්ලීමක් කරලා තිබෙනවා.ඒක තාම ආවේ නෑ.ආවාම කහගොල්ලෙන් තමයි හදන්න වෙන්නේ.ප්‍රාදේශීය සභා 28 ම වැඩ කරන්නේ කහගොල්ලේ යාන්ත්‍රික වැඩපලෙන්.ගරු ආණ්ඩුකාරවරු 04 දෙනෙකුට මොනරාගල උප කාර්යාලයක් දාලා දෙන්න කියලා ඉල්ලීම් කරලා තියෙනවා. මේ වගේ ප්‍රායෝගික ගැටළු හේතුවෙන් තමයි මේක හදන්න ප්‍රමාද වුණේ. දැනට මෝටර් ග්‍රේඩරය ධාවන මට්ටමේ තියෙනවා. නමුත් වැඩ කරන්න බෑ.

**ගරු ප්‍රාදේශීය සභා උපසභාපති ඩබ්.ඒ.රංජිත් වික්‍රමආරච්චි මැතිතුමා අදහස් දක්වමින්**

සභාවෙන් අවසරයි. මෝටර් ග්‍රේඩරයේ එන්ජිම කහගොල්ලෙන් හැදුවා කියලා සහතිකයක් ලබාදීලා තියෙනවද?

**ගරු ප්‍රාදේශීය සභා සභාපති නිකවත්තේ නන්දසිරි මැතිතුමා අදහස් දක්වමින්**

ඔව් හදලා ඉවරයි කියලා ලියුමක් එවලා තියෙනවා.

පෙ.ව10.00ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.පී.සංජීව ප්‍රදීප් මැතිතුමා පැමිණෙන ලදී

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි පී.ඉන්ද්‍රාණී මුතුකුමාරණ මැතිතුමිය අදහස් දක්වමින්**

ගරාජ් එකක වාහනයක් හැදුවාම එක සැරේට මෙන්න ගෙනියන්න කියලා දෙන්නේ නැහැනේ. පරීක්ෂා කරලා දෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති නිකවත්තේ නන්දසිරි මැතිතුමා අදහස් දක්වමින්**

මන්ත්‍රීතුමිය මේක එහෙම එකක් නෙවෙයි. ඔපරේටර්ලා ඉද්දි මේක ධාවනය කළා. ජැක්සීල් වලින් තමයි ඔයිල් ලීක් වෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි පී.ඉන්ද්‍රාණී මුතුකුමාරණ මැතිතුමිය අදහස් දක්වමින්**

ආපු දවසේ ඉඳලා යන්ත්‍රෝපකරණ ඒකකයේ මැෂින් හදන එක ගැන කතා කරනවා. තාම එකක්වත් හදලා දැම්මේ නෑ. උපසභාපතිතුමා කියනවා ලක්ෂ විස්සක් දීලා ඒකත් තාම හදලා නෑ කියලා.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති නිකවත්තේ නන්දසිරි මැතිතුමා අදහස් දක්වමින්**

මන්ත්‍රීතුමිය වැරදි ප්‍රකාශ කරන්න එපා. උපසභාපතිතුමා ප්‍රකාශ කළේ, මේ මැෂින් එක හදලා ධාවනය කරලා තියෙනවා. නමුත් සභාවට ආය දැම්මා ජැක්සීල් හදන්න කියලා. ඒක හැදුවද නැත්ද කියලා විශ්වාස කරන්න බෑ. ඇයි ප්‍රමාද කියන එක අහන්නේ. ඔබතුමිය කියන්නේ වෙන කතාවක්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි පී.ඉන්ද්‍රාණී මුතුකුමාරණ මැතිතුමිය අදහස් දක්වමින්**

මට තේරෙන විදිහට මම කතා කළේ. හැමෝගෙම බුද්ධි මට්ටම එක වගේ නෑ. කාටත් තමන්ගේ මතය ප්‍රකාශ කරන්න අයිතියක් තියෙන්න ඕනි. දැන් බලාගෙන ගියාම නොදන්න කමට හරි මෝඩ කමට හරි කතා කරන්න අපට අවස්ථාවක් නැති එකයි තියෙන්නේ. මම අහන්නේ මේකයි. මගේ වචනෙටත් සවන් දෙන්න. දැන් ඔබතුමා කියන්නේ ලක්ෂ විස්සක් දීලා මෝටර් ග්‍රේඩරය හදාගෙන ආවා. ඊට පස්සේ වැඩ කරන්න හදනකොට ජැක්සීල් ගිහිල්ලා කියලා ආයෙ ඒකේ ජැක්සීල් ගහන්න දුන්නා. ඒකත් හරි. ලක්ෂ විස්සක් එතන ඉවරයි. දැන් ජැක්සීල් ගහන්න තව මුදල් යනවා. ඒකත් හරි. ඒක නිවැරදිව කරලා තියෙනවද කියලා අපි දැනගන්නේ කොහොමද?

**ගරු ප්‍රාදේශීය සභා සභාපති නිකවත්තේ නන්දසිරි මැතිතුමා අදහස් දක්වමින්**

ඒක තමයි මම පැහැදිලි කළේ. ඔබතුමිය අහගෙන හිටියට තේරුම් අරන් නෑ.

**ගරු ප්‍රාදේශීය සභා උපසභාපති ඩබ්.ඒ.රංජිත් වික්‍රමආරච්චි මැතිතුමා අදහස් දක්වමින්**

මම ඇහුවේ ලක්ෂ විස්සක් වියදම් කරලා එන්ජිම හදලා ධාවන තත්ත්වයට ගෙන එන කොට මේ ජැක්සීල් ගියා. ඊට පස්සේ ජැක්සීල් ගිය නිසා එතනම තියෙනවා. එතකොට මාස 09ක් විතර ගියා. මේක හදලා නෑ. මම කියන්නේ අපට විශ්වාස නෑ මේකත් හදලා තියෙනවද කියලා. මේ සභාවේ නිලධාරින් සේවකයෝ කරන වැඩ අනුව මේක හදලද කියලා අපට විශ්වාස නෑ. මේක හැදුවේ නැත්නම් කියයි. ලක්ෂ විස්සක් වියදම් කරලා මන්ත්‍රීවරු තමයි ඕක හැදුවේ. මොනා කරාද දන්නෑ කියලා. අපේ නමට කැළලක් වන නිසා හැදුවද නැත්ද කියලා ඔප්පු කරන්න පුළුවන්ද කියලා මං ඇහුවේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලසන්ත ලක්මාල් මතහවීර මැතිතුමා අදහස් දක්වමින්**

සියලු දෙනාගෙන් අවසරයි.මන්ත්‍රී මණ්ඩලය කවුරුවත් සල්ලි අරන් ගිහින් හැදුවේ නෑ.කාටවත් එකට මණ්ත්‍රීවරුන්ට චෝදනා කරන්න බෑ.ලේකම්තුමිය ඇතුලු නිලධාරි මණ්ඩලයට තමයි මුදල් වෙන් කරලා තිබෙන්නේ. අපි අනුමැතිය ලබා දීලා විතරයි තියෙන්නේ අපි හොරකම් කරා කියලා කියන්න බෑ. මේක ධාවන මට්ටමේ තියෙනවා. වැඩ කරන්න බෑ. ජැක්සීල් ගහලා නැති නිසා මාස දෙක තුනකට පෙර සභා වාරයක අනුමැතිය දුන්නා කහගොල්ලේ කරන්න කියලා. මේ වෙනකල් සිද්ධ වෙලා නෑ. ජැක්සීල් ටික හදනවනම් වැඩ කරන්න පුළුවන්. අපි 2018 එනකොට වාහන ටික සේරම වැඩ කරන්න පුළුවන් මට්ටමක තිබ්බේ නෑ. ඒ සියලු දේ හදලා වැඩට දාලා තියෙනවා. උප සභාපතිතුමා අපිට චෝදනා කරන්න බෑ කාටවත් වැඩ අපි සාධාරණව කරලා තියෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. සුනිල් මැතිතුමා අදහස් දක්වමින්**

සභාවෙන් අවසරයි. මම යෝජනා කරනවා වාහන අළුත්වැඩියාව සම්බන්ධව කහගොල්ලෙන් වාර්තාවක් ඉදිරිපත් කරන්න කියලා මේ කාරණය සියලු දෙනාට දැන ගැනීම සඳහා

**ගරු ප්‍රාදේශීය සභා උපසභාපති ඩබ්.ඒ.රංජිත් වික්‍රමආරච්චි මැතිතුමා අදහස් දක්වමින්**

කහගොල්ලට කතා කරලා මේක ඉක්මන් කරලා කරන්න මෝටර් ග්‍රේඩර් දෙකක් තියෙනවානේ එකක් මුදලට හරි දාලා අනෙක් එක පාරවල් ටික හරි හදන්න දාන්න සම්බන්ධ කරන්න නැත්නම් ඔහේ හදලා තියයිද දන්නෑ. කහගොල්ලට කතා කරන්න ඊලග සභා වාරය එනකොට අපට උත්තරයක් දෙන්න.

පෙ.ව10.10 ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.එස්.සී.අත්තනායක මැතිතුමා පැමිණෙන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. සුනිල් මැතිතුමා අදහස් දක්වමින්**

ගරු සභාපතිතුමා , උපසභාපතිතුමා ඇතුළු සියලුම මන්ත්‍රී මණ්ඩලය , ලේකම්තුමිය ප්‍රධාන නිලධාරින් මණ්ඩලයෙන් අවසරයි.ඔබ සියලු දෙනාටම ලැබු වූ 2023 නව වසර වාසනාවන්ත නව වසරක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා. අද දිනය අවසාන සභාවාරය වෙන්නත් පුළුවනි.ගරු සභාපතිතුමණි,දැන්වීම් පුවරු සම්බන්ධ අදහසක් තියෙනවා.පසුගිය වර්ෂයේ දැන්වීම් අවසාන මොහොතේ කපා ඉවත් කළා.මේ දැන්වීම් පුවරුවලින් සභාවට ලැබෙන්න තිබෙන ආදායම ලබාගත යුතුය.එකට විවාදයක් නෑ. ඒක අනිවාර්යෙන්ම කළ යුතුයි.දැන්වීම් පුවරුවලට මුදල් අයකරනවා නම් ඒ මුදල් අයකරන කුවිතාන්සියේ තියෙන්නට ඕනි මුදල් ලබා ගැනීමේ දිනයෙ සිට අවසාන වන කාලවකවානුව.මේ කිසිවක් නැතිව ඒ දැන්වීම් පුවරු ඒ අයට නොකියා ඉවත් කරනවාද? දැන්වීම් පුවරුවේ කාලය අවසන් නැවත මුදල් ගෙවන්න කියලා දැන්වීම් කරලා තිබෙනවාද? මට ලැබුණා කේ.එම්.විජේසුන්දර මහත්තයාගේ මුදල් භාරගත් කුවිතාන්සියක්.ඒක 2022.02.10 තමයි රු:2400/= ක් භාර ගෙන තියෙන්නේ.ඒ කුවිතාන්සියේ දින වකවානු නෑ.එහෙම නම් මේ පුද්ගලයා බලපොරොත්තු වෙන්නේ මේ මුදල මුළු අවුරුද්දටම වලංගුයි කියලා.ලේකම්තුමිය මේක නිලධාරීන්ගෙන් සිදුවුණ වැරැද්දක් බව මට අනාවරණය වෙනවා.මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වන්න.ඒ වගේම බුත්තල පොළේ කඩහිමියන්ගෙන් ව්‍යාපාරිකයෙක් ඇවිල්ලා ඉල්ලීමක් කළා.බොහොම හොඳයි පොළේ ඉරි ඇඳලා තිබෙනවා.ඒත් ඉරිවලින් ඉදිරියට බඩු දානවාලු.ඒ නිසා ඉල්ලීමක් කරනවා නිලධාරී මහත්වරු දැනුවත් කරලා ඉරෙන් පිටුපස්සේ බඩු දාන්න කියලා දැනුවත් කරන්න.ඒ වගේම මම සභාපතිතුමාට ස්තූති වන්ත වෙනවා ගරු සභාවට ඇවිල්ලා මගේ බලාපොරොත්තුවක් තිබුණේ මේ ප්‍රදේශයේ දූ දරුවන් වැරදිවලට යොමුවන මොහොත වැරදි වැඩ කරන ස්ථාන අවම කරගෙන මේ දරුවන් ඒවායෙන් ගලවා ගැනීමට කටයුතු කරන්න.සුසාන භූමිය සුද්ද පවිත්‍ර කිරීම සම්බන්ධ ඔබතුමාට ස්තූති වන්ත වෙනවා.දැන් ඒ කාර්යය සිදු

කෙරෙමින් පවතිනවා.ගරු සභාපතිතුමා ඇතුළු සියලු දෙනාටත්,බුත්තල ප්‍රදේශවාසි සියලු දෙනාටත් ලැබුවා වූ 2023 නව වසර සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරනවා කියලා.

**ගරු ප්‍රාදේශීය සභා උපසභාපති ඩබ්.ඒ.රංජිත් වික්‍රමආරච්චි මැතිතුමා අදහස් දක්වමින්**

ගිය සභාවාරයේ සභාවේ මන්ත්‍රීලා තුන්දෙනෙක් එක්ක කමිටුවක් පත් කළා.එදා උදේ 10 විතර ආවේ.සංජීව මන්ත්‍රීතුමයි. මමයි, සුනිල් මන්ත්‍රීතුමාටත් කතා කළා.කළුපහන මන්ත්‍රීතුමාටත් කතා කළා එතුමා පොල් වේලනවා කිව්වා.ඇත්ත කතා කරන්න එපැයි.පැරණි පොළපිටියේ මඩේ කුඩුගල් ටිකක් දාලා තලලා කොන්ක්‍රීට් ඒක දාන්න හැදුවේ.මම ඒක නතර කළා.මෙහෙම දාන්න එපා කියලා.කාර්මික නිලධාරී මහත්තයා ගෙන්නුවා.කාර්මක නිලධාරී මහත්තයා කිව්වා පූජිත මහත්තයාට කතා කළා කියලා. උදේ 10 ඉඳලා 4 වෙනකම් හිටියා එයාලා එනකම්.ඒ අතරේ ඒකෙන් මෝටර් කරන වතුර කාණුවට දැම්මා.මම සමීර මහත්තයාට කතා කරලා කිව්වා. මේ කාණුව දැන් සුද්ද කරන්න කියලා.සුනිල් මන්ත්‍රීතුමා හිටියා සංජීව මන්ත්‍රීතුමා හිටියා.ඒ වෙලාවේ මැෂින් එකක් ගෙනල්ලා කාණුව ඇදලා දැම්මා.හැන්දෑවේ 4 විතර මහත්තයා ආවා.අපි තුන්දෙනා කිව්වා විස්තරේ.ඊට පස්සේ TO මහත්තයාට කතා කළා. TO මහත්තයා නිවාඩු කිව්වා.කොන්ත්‍රාත් කාරයත් නෑ පෙෂර්ද කොහෙද හැදිලා ගියා කිව්වා.පසුව අඩි 2 හමාරක් හාරන්න කිව්වා.මඩ ඔක්කොම අයින් කරන්න කිව්වා.අයින් කරලා යකඩ තහඩු කෙලින් ගහලා දාන්න කිව්වා.ඊට පස්සේ අරවා හාරලා දාන්න පටන් ගත්තා.ස්තූතිවන්ත වෙනවා අපි සමීක්ෂණයට දැම්ම නිසා ඒක බැලුවා.අපි තව අවුරුදු 10,15 ක් ජීවත් වෙයිද දන්නේනෑ.අපේ දූවාදරුවන්ට මේක තියෙනවා අපි හැදුවා කියලා.අපි මන්ත්‍රී මණ්ඩලය ලක්ෂ 5 ක් වියදම් කරලා පාරවල් හැදුවා කොන්ක්‍රීට් එක දානකොට TO මහත්තයා ලඟම ඉන්නවා ඉවර වෙනකම්.පස්සේ පෙරෙදා රෑ ලයිටුත් නැතුව කොන්ක්‍රීට් එක දානවා.මම ලේකම්තුමියට කතා කළා ලේකම්තුමිය කිව්වා TO මහත්තයාට කතා කරන්නම් කියාලා. TO මහත්තයා කිව්වා දැන් එතනට එන්නම් කියලා.ආවද දන්නේ නෑ.මේවා මහජනතාවගේ සල්ලි.මෙහෙම කරන්න හොඳ නෑ කොන්ත්‍රාත් කාරයන්ට.රෑ TO මහත්තයා මට කතා කළා.උපසභාපතිතුමා සමාවෙන්න මම යනවා.මම ෆීල්ඩ් එකේ ගියා.රෑ මොන ෆීල්ඩ් එකේද යන්නේ.ඒ වගේ වැඩ කරන්න එපා.මේකටත් අපි සමීක්ෂණයක් තියෙනවා. TO මහත්තයාගෙන් ඇස්තමේන්තුව හය පාරක් ඉල්ලුවා දුන්නේ නෑ.පස්සේ මම කතා කළාම කිව්වා සභාපති මහත්තයා කියනවා නම් දෙන්නම් කියලා.එතකොට අපි මන්ත්‍රීවරුත් නෙවෙයි,උප සභාපතිත් නෙවෙයි.මන්ත්‍රී කෙනෙක් ඉල්ලුවත් දෙන්න ඕනි.ඊට පස්සේ මන්ත්‍රීලා තුන්දෙනාම ආවා.ලේකම්තුමියට කතා කළා.ලේකම්තුමිය කිව්වා ඔබතුමන්ලා ලියුමක් දෙන්න කියාලා.කළුපහන මන්ත්‍රීතුමා කිව්වා ලියුමක් දීලා තියෙනවා කියලා.ලේකම්තුමියට කෝල් එකක් ඇවිල්ලා ගියා.ලේකම්තුමියට නැවත කතා කළා ආවේ නෑ.ලේකම්තුමියට ඇස්තමේන්තුව කොහොමහරි එවන්න කිව්වා.වාර්තාව එවන දවසේ ඇස්තමේන්තුව එවලා තිබ්බා.මම ඒක වවුමේ ඉන්න හින්දා සුනිල් මන්ත්‍රීතුමාට දුන්නා.සභාපතිතුමා මේවා හරියට කරන්න කියලා නිලධාරීන්ට උපදෙස් දෙන්න.මේක අයාලේ යන සභාවක් කරන්න එපා.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති නිකවත්තේ නන්දසිරි මැතිතුමා අදහස් දක්වමින්**

සභාව නියෝජනය කරන නියෝජිතයෝ තමයි මන්ත්‍රීවරු කියන්නේ.එතුමන්ලා පත්කරලා තියෙන්නේ අධීක්ෂණයට.ඊට අමතරව සමාජ විගණන කමිටුවක් තිබෙනවා.එයට වෙළඳ ව්‍යාපරිකයෝ හා පක්ෂ විපක්ෂ දේශපාලන කණ්ඩායම් හඳපු ලොග් සටහන් පොත් සියල්ල එතන තිබෙනවා.අපේ මන්ත්‍රීතුමන්ලා කණ්ඩායමේ බලය තමයි මේවා හොයලා බලන එක සභාවේ කාර්යභාරයක්.මේක අපේ කණ්ඩායම හොඳින් කරලා තිබෙනවා.ඉදිරියෙදීත් මේක තමයි වෙන්න ඕනි.මේ ඇස්තමේන්තුව ගත්තට අපට අවබෝධයක් නැනේ.මේකේ ප්‍රධාන ඉංජිනේරුතුමත් එක්ක විගණන කමිටුවට වෙනම දිනයක් ලබා දෙනවා.එහිදී මේ සම්බන්ධව ඔබතුමන්ලාට තිබෙන ප්‍රශ්න ගැටළු මොනවද භාවිතා කරපු කම්බි මොනවද,කොහොමද වෙන්න ඕනි යන කරුණු ගැන සාකච්ඡා කරන්න ලඟදිම දිනයක් ලබා දෙන බව ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.පී.සංජීව ප්‍රදීප් මැතිතුමා අදහස් දක්වමින්**

ගරු සභාපතිතුමා,උප සභාපතිතුමාගෙන් අවසරයි.ගරු සභාපතිතුමණි,අපට දැනගන්න ඕනි මේක ලොකු ව්‍යාපාරයක්නේ.මේක අධීක්ෂණය කරන්න කමිටුවක් පත්කරලා තිබෙනවා.දැන් මෙතනදී මමත් TO මහත්තයාට කතා කළා. TO මහත්තයා අපිට කතා කළා ඊයේ උදේ.නිලධාරීන් අපහසුතාවයට පත් කරනවා නොවෙයි.අයාලේ යනවා කියන්නේ ඒකයි.අපි ලඟ වීඩියෝ තියෙනවා.සභාපතිතුමාට කතා කළා මෙහෙම දෙයක් වෙනවා ටිපර් එකේ ටියුබ් එකේ එක පැත්තකට ගහගෙන JCB එකේ කොක්ක පැත්තේ ලයිට් එක දාගෙන කොන්ක්‍රීට් එක දානවා.ගරු සභාපතිතුමා එක සුදුසු වැඩක් නෙවෙයි.මේ වීඩියෝ එක ක්‍රියාත්මක කළොත් ඒ කොන්ක්‍රීට් එක ගලවලා මුල ඉදලා දාන්න වෙනවා.ඔබතුමා ප්‍රධාන පුරවැසියා හින්දා ඔබතුමා දැනුවත් කළේ. TO මහත්තයා මට කතා කළා සංජීව මන්ත්‍රීතුමා මෙහෙම දෙයක් වුණා මම මේ ලඟට ගිහින් හිටියේ අඩි 3 ක් විතර තියෙන්නේ කිව්වා.මේ වීඩියෝ එකේ බලන්න අඩි 3 ක්ද තියෙන්නේ කියලා.අඩි 20 ක් විතර දානවා.උප සභාපතිතුමා කිව්වා වගේ පාරක් කොන්ක්‍රීට් කරන කොට TO මහත්තයා ඉන්න ඕනි.සභාපතිතුමා පිළිගන්න ඔබතුමා ප්‍රධාන පුරවැසියා නිසා කියන්නේ.ඉන්දික මහත්තයා මේවා ඔබතුමා වාර්තා කරන්න.සුනිල් මන්ත්‍රීතුමා ලඟ වීඩියෝ එක තියෙනවා.මුල ඉදලා පෙන්වන්නම්.අපිටවත් පෙන්නේ නෑ මොකක්ද මේ දාන කොන්ක්‍රීට් එක කියලා.මම කිව්වා TO මහත්තයා ඔය කට්ටිය අවුරුදු 10,15 හරි රස්සාව කරලා මේ සභාපතිලා හරි වෙනකට්ටිය හරි යයි කිව්වා.අපි අවුරුදු 45 ක් මේ ටවුමේ ජීවත් වෙනවා.මේ ගොඩනැගිල්ල හදන්නේ ටවුන් එකේ වෙළඳ ප්‍රජාවට. TO මහත්තයා කියනවා රෑ වුණ නිසාලු එහෙම දාන්නේ.රජයේ ආයතනවල කොන්ක්‍රීට් එහෙම දාන්න බෑ.දන්නේ නැත්නම් අපෙන් හරි දැන ගන්න.මේකට වහාම ක්‍රියාමාර්ගයක් ගන්න.නිලධාරීන් වැරදි කරනවා නම් නවත්වන්න.මේකේ හොරකම් වුණා.ඒකයි අපි කෑ ගැහුවේ.ඒක තමයි කිව්වේ අයාලේ ගිය සභාවක් කියලා.ඔබතුමා හරහා නිතීය ක්‍රියාත්මක වුණේ නෑ.ඇත්ත කතාව හොරු දෙපාරක් අහුවුණා.සභාපතිතුමා ඡන්දයක් තියන්නේ නෑ. කොමසාරිස්තුමා යටතට දාලා මාස 6 ක් අවුරුද්දක් යනකම් තියෙයි.සභාපතිතුමා දැන් ඔයාගේ කාලෙත් ඉවරයි.අපේ කාලෙත් ඉවරයි.කොහොම වුණත් අවධානෙන් ඉන්නේ.කොන්ත්‍රාත් කාරයාට කතා කරලා තීරණයක් ගන්න.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති නිකවත්තේ නන්දසිරි මැතිතුමා අදහස් දක්වමින්**

ඒක තමයි මම කිව්වේ.ප්‍රධාන ඉංජිනේරුතුමාත් එක්ක අධීක්ෂණ කමිටුව සාකච්ඡා කරමු කියලා.මාධ්‍යට නොවෙයි සභාව කරන්නේ යන බව ප්‍රකාශ කරමින්,

සෑම කටයුත්තක් සඳහා ම ලබාදුන් සහයෝගය වෙනුවෙන් සියලු දෙනාට ස්තුතිවන්ත වන බවත්, අද දින සභාවාරය සඳහා සහභාගී වූ උප සභාපතිතුමා, ගරු මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලාට මෙන්ම ලේකම්තුමිය ප්‍රමුඛ කාර්ය මණ්ඩලයේ සැමට ස්තුති කරන ලදී.

සභාවේ කටයුතු පෙ.ව.10.25 ට අවසන් කරන ලදී.

නිකවත්තේ නන්දසිරි,
සභාපති,
බුත්තල ප්‍රාදේශීය සභාව.

පිටපත්:-

01 පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන දෙපාර්තමේන්තුව , බදුල්ල
02 සහකාර පළාත් පාලන කොමසාරිස් , සහකාර ප.පා.කොමසාරිස් කාර්යාලය,මොනරාගල.
03 විගණන අධිකාරී, විගණන උප කාර්යාලය , මොනරාගල.